**තුම්පනේ ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව විස්තරය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලදවිගණනමතයටපදනමක්සපයාගැනීමේ දී ,වංචාහෝවැරදි හේතුවෙන්,මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකිප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ඇති වීමේඅවදානම්හඳුනා ගැනීමහාතක්සේරුකිරීමසඳහාඅවස්ථාවෝචිතවඋචිත විගණනපරිපාටිසැලැසුම්කරක්‍රියාත්මකකරනලදී.වරදවාදැක්වීමහේතුවෙන් සිදු වනප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්සිදු වනබලපෑමටවඩාවංචාවකින්සිදු වන්නාවූබලපෑමප්‍රබලවන්නේඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විතමඟ හැරීමෙන්,වරදවාදැක්වීමෙන්හෝඅභ්‍යන්තරපාලනයන්මඟ හැරීමෙන්වැනි හේතු නිසාවනබැවිනි.
- අභ්‍යන්තරපාලනයේසඵලදායිත්වයපිළිබඳවමතයක්ප්‍රකාශකිරීමේඅදහසින්නොවූව ද, අවස්ථාවෝචිතවඋචිතවිගණනපරිපාටිසැලැසුම්කිරීමපිණිසඅභ්‍යන්තරපාලනයපිළිබඳවඅවබෝධයක්ලබා ගන්නාලදී.

- භාවිතාකරනලදගිණුම්කරණප්‍රතිපත්තිවලඋචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවලසාධාරණත්වයසහකළමනාකරණයවිසින්කරනලදසම්බන්ධිතහෙළිදරව්කිරීම්අගයනලදී.

- මූල්‍ය ප්‍රකාශනවලව්‍යුහයහාඅන්තර්ගතයසඳහාපාදකවූගනුදෙනුහාසිද්ධීන්උචිතහාසාධාරණවඇතුළත්වීඇතිබවසහ හෙළිදරව්කිරීම්ඇතුළත්මූල්‍ය ප්‍රකාශනවලසමස්තඉදිරිපත්කිරීමඅගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව
--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ
------------------------------------------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.15,166,453 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුමෙන් නිවැරදි කරන බව හා ලැබිය යුතු මුද්දර ගාස්තු සම්බන්ධයෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් විමසන බව | මුද්දර ගාස්තු ආදායම නිවැරදිව හඳුනා ගැනීම හා නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී සභාව සතු වත්කම් වැඩි දියුණු කිරීම සඳහා අවස්ථා 06 කදී දරා තිබුණු රු.10,010,588 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සැකසීමේ දි නිවැරදි කරන බව | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | සභාවේ අරමුදල්මගින් ඉදිකළ ජල ව්‍යාපෘතියක් සඳහා ගෙවා තිබුණුරු.6,500,000 නැවත ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කරන බව | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු එහෙත්, වැඩ නිම කර නොතිබුණු ව්‍යාපෘති 18 ක ඇස්තමේන්තුගත වටිනාකම රු.3,375,000 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අමුද්‍රව්‍යවල මිල ගණන් උච්ඡාවචනය වූ බැවින්, කර්මාන්ත අවසන් කිරීමට නොහැකි වූ බව | ණයහිමියන් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ස්ථාවරවත්කම් ශේෂය රු.202,832,157 ක් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය රු.201,911,569 ක් වූ බැවින්, රු.920,588 ක වෙනසක් නිරික්ෂණය විය. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුය |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් උපයෝජනය කර ඉටු කරන ලද කර්මාන්ත 02 කට අදාළව ගෙවිය යුතු රු.933,267 ක් ණයහිමියන් ලෙසට ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුමෙන් නිවැරදි කරන බව | ණයහිමි ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (උ) | සමාලෝචිත වර්ෂයටඅදාළකඩ කුලි රු.1,165,025 ක් ආදායම් හා වියදම් ගිණුමේ කුලී ආදායම් ලෙසට ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුමෙන් නිවැරදි කරන බව | වර්ෂයේ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 05 කට අදාළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් ශේෂ හා උපයෝගී ලේඛනවල ශේෂ අතර රු.1,395,802 ක වෙනසක් පැවතුණි. | වසර ගණනාවකට වැඩි කාලයක සිට පවතින හිඟ බැවින්, නිවැරදි කර විගණනයට යොමු කරන බව | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි අගය ගිණුම්වල ගැළපිය යුතුය |

1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

--------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, රු.69,946,581 ක් වූ වත්කම් විෂයයක් හා රු.17,872,315 ක් වූ බැරකම් විෂයයක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ලේඛනවල තොරතුරු සටහන් කිරීම ආරම්භ කළ බවහා කඩිනමින් විගණනය වෙත යොමු කරන බව | වත්කම් හා වගකීම් ශේෂ තහවුරු කර ගත හැකි ලේඛන පවත්වා ගෙන යා යුතුය |

1.7 අනුකූල නොවීම්

--------------------

නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

---------------------------------------------------

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හාරෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 126 වගන්තිය | බලපත්‍රයක් යටතේ පවත්වා ගෙන යන වැලි තොටු පොළ සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කර අය කළ යුතු ගාස්තු ගැසට් පත්‍රයේ පළ නොකර රු.205,000 ක ගාස්තු අය කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ අගෝස්තු දක්වා අවසර ලබා ගෙන ඇති බව | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගත යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 571 | තැන්පතු ලේඛනයේ ඇතුළත් 2015 සිට 2018 කාල පරාසය තුළ තැන්පත් කරන ලද වසර 03 ඉක්ම වූ රු.1,287,626 ක ඉකුත් තැන්පතු ශේෂ සම්බන්ධව අදාළ කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම තුළින් ගැළපීම් සිදු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,820,904 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,524,622 ක්විය.

2.2 ආදායම් පරිපාලනය

-------------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසානයට අය විය යුතු රු.1,757,218 ක වරිපනම් බදු අය කර නොතිබුණු අතර එම ශේෂය තුළ වසර 01 සිට වසර 06 අතර කාල පරාසයක සිට පැවත එන ඒකකයක හිඟය රු.1,000 ට වැඩි දේපළ 433 කට අදාළව අය විය යුතු රු.1,493,962 ක් හා වරිපනම් දේපළෙහි අයිතිකරු නිවැරදිව හඳුනා නොගත් ඒකක 123 කට අදාළව අය විය යුතු රු.90,903 ක් ඇතුළත්ව තිබුණි. | ආදායම් ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් කරන බව | හිඟ වරිපනම් අය කර ගත යුතුය |
| (ආ) | කසළ බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.739,970 ක කසළ බදු ආදායමක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.10,000 ඉක්ම වූ ආයතන 21 කට අදාළව අය විය යුතු රු.276,750 ක් හා බිල් කිරීම් නවතා තිබුණු ආයතන 95 කට අදාළව අය විය යුතු රු.571,550 ක් ඇතුළත්ව තිබුණි. | හිඟ කසළ බදුවලින් කොටසක් අය කර ඇති බව හා ඉතිරි මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ කසළ බදු අය කර ගත යුතුය |
| (ඇ) | කුලී | | |
| | කඩ කුලී | | |
| | හතරලියද්ද ප්‍රදේශයේ කඩ කාමර සඳහා 2017 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබා දුන් තක්සේරුව අනුව කුළී අය නොකිරීම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයට රු.547,250 ක කුළී ආදායමක් සභාවට අහිමි වී තිබුණි | අයිතිය ලබා නොදීම මත ගිවිසුම් අලුත් කිරීමේ හැකියාවක් නොමැති බව | නව තක්සේරු ක්‍රියාත්මක කර කඩ කුළී අය කළ යුතුය |
| (ඈ) | ජල ආදායම් | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.696,931 ක ජල ගාස්තු අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ජල යෝජනා ක්‍රම 07 ක පාරිභෝගිකයින් 80 කින් 2017 වර්ෂයේ සිට අය විය යුතු රු.249,515 ක් ඇතුළත්ව තිබුණි. | හිඟ හිටි ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ ජල ගාස්තු අය කළ යුතුය |

(ඉ) ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු
--------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිතවර්ෂයඅවසානයට අය විය යුතු රු.1,974,490කත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ රු.50,000 ට වැඩි ත්‍රීරෝද රථ නැවතුම් පොළවල් 18 කට අදාළව අය විය යුතු රු.1,671,165 ක් ඇතුළත්ව තිබුණි. | ත්‍රීරෝද රථ හිමියන් හා පොලිසිය සමඟ සාකච්ඡා පවත්වා හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟව පවතින ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කළ යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හානි හා පාඩු අයකර නොගැනීම | | |
| ඉකුත් හා සමාලෝචිත වර්ෂවල දී, සිදු කර තිබුණු භාණ්ඩ සමීක්ෂණයේ දී, රු.74,250 ක කාය වර්ධන භාණ්ඩ කට්ටල 08 ක ඌනතාවයක් හඳුනා ගෙන තිබුණ ද, මුදල් රෙගුලාසි ප්‍රකාරවපරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අදාළ වටිනාකම අය කර නොතිබුණි. | පොලිසියේ පැමිණිල්ලක් ගොනු කර ඇති බව හා වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ පවත්වන බව | මුදල් රෙගුලාසි පරීක්ෂණ පවත්වා ඉදිරි කටයුතු සිදු කළ යුතුය |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හතරලියද්ද වෙළඳ සංකීර්ණයේ කඩකාමර 04 ක්වසර 1 ½ සිට වසර 04 ක කාල පරාසයක සිට බදු දී නොතිබුණු අතර, ඒ හේතුවෙන් සභාවට ආදායම් අහිමි වී තිබුණි. | කඩ කාමරවල අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පවරා නොදීම මත නව ගිවිසුම්වලට එළඹීමට නොහැකි බව | කඩ කාමර බදු දීම මඟින් ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය |

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු රු.28,888,879 ක වාහන 06 ක් අතුරින් වාහන 02 ක් 2014 වර්ෂයේ සිට ද, වාහන 04 ක් ඉකුත් වර්ෂයේ සිට ද රියැදුරන් නොමැති වීම නිසා ඌන උපයෝජිතව පැවතුණි. | රියැදුරන් නොමැතිවීම මත වාහන ඌන උපයෝජිත වී පවතින බව | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය |

3.4 වාහන ඇණිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | කැබ් රථයක් අනතුරට පත්වීම | | |
| (අ) | 2014 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව විසින් ධාවනය කරමින් සිටිය දී ගිනි ගැනීමට ලක් වී තිබුණු මෝටර් රථයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පාඩු හා අලාභ හඳුනා ගැනිම සඳහා වූ පරීක්ෂණයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වසර 07 ක් ගත වන තුරු පවත්වා නොතිබුණු අතර වාහනය අලුත්වැඩියා කටයුතුවලට යොමු කිරීමෙන් තොරව වර්ෂ 07 කට අධික කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණි. | දැනට මූලික පරීක්ෂණයක් හා 104(03) පරීක්ෂණයක් සිදු කර ඇති බවත් ආනයනය තහනම් වීම මත අලුත්වැඩියා කටයුතු නතර වී ඇති බව | අනතුර සම්බන්ධයෙන් අදාළ මුදල් රෙගුලාසි පරීක්ෂණ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය |